# මැතිවරණ දෙපාර්තමේන්තුව
# தேர்தல்கள் திணைக்களம்

පොදු කාර්යාලය : 011-2868441, 2868442, 2868443
பொது அலுவலகம்

ෆැක්ස්/தொலைநகல் : 011-2868426

මැතිවරණ මහලේකම් කාර්යාලය
සරණ මාවත, රාජගිරිය (10107)

தேர்தல்கள் செயலகம்,
சரண மாவத்தை, இராஜகிரிய (10107)

*web : www.slelections.gov.lk* *e-mail : info@slelections.gov.lk*


මගේ අංකය: **PE/2015/4**
எனது இல.

ඔබේ අංකය :
உமது இல..

දිනය: **2015.06.29**
திகதி :

## ලේඛනගත තැපැල

## ඉතා වැදගත්

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
සියලුම පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
ජාතික පොලිස් කොමිෂන් සභාවේ ලේකම්,
සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්,
සියලුම පළාත් ආණ්ඩුකාරවර ලේකම්වරුන්/ පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරුන්,
සියලුම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරුන්,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
සියලුම රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සභාපතිවරුන්/ සාමාන්‍යාධිකාරීවරුන්

**පාර්ලිමේන්තු මහ මැතිවරණය - 2015**

**රජයට සහ රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවලට අයත් දේපල පාර්ලිමේන්තු මහ මැතිවරණ කාල සීමාව තුළ දී අනිසි ලෙස භාවිතා කිරීම වැළැක්වීම සහ පාර්ලිමේන්තු මහ මැතිවරණ කාල සීමාව තුළ දී නිලධාරීන්, සේවකයන් බඳවා ගැනීම/ උසස් කිරීම/ මාරු කිරීම සීමා කිරීම හා අත්හිටුවීම**

පාර්ලිමේන්තු මහ මැතිවරණය 2015.08.17 දින පැවැත්වීමට නියමිත අතර, ඒ සඳහා නාමයෝජනා කැඳවීමේ දැන්වීම 2015.06.26 දින ප්‍රසිද්ධ කර ඇත. 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත ප්‍රකාර ඡන්ද විමසීමේ කාල සීමාව, ඒ මැතිවරණයේ නාම යෝජනා කාලසීමාවේ පළමු දිනෙන් ආරම්භව ඡන්ද විමසීමක් පවත්වනු ලබන දිනට ඉක්බිතිව ම එළඹෙන දිනෙන් අවසන් වන කාල පරිච්ඡේදය වුවද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ඵ අනු ව්‍යවස්ථාවේ සඳහන් වන පරිදි ඡන්ද විමසීමක් පැවැත්වෙන කාලසීමාව ලෙස මැතිවරණයක් සම්බන්ධයෙන් වන ප්‍රකාශයක් හෝ නියමයක් හෝ කරනු ලැබූ දිනයෙන් ආරම්භව, එම ඡන්ද විමසීමට අදාළව ප්‍රතිඵල ප්‍රකාශයට පත්කරනු ලබන දිනයෙන් අවසන් වේ. මැතිවරණයක් පවත්වනු ලබන කාල පරිච්ඡේදය තුළදී, රජයට හෝ යම් රාජ්‍ය සංස්ථාවකට හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයකට හෝ අයත් යම් නිශ්චල හෝ චංචල දේපලක් ඒ ඡන්ද විමසීමේ දී තරඟ කරන යම් අපේක්ෂකයෙකු හෝ යම් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් හෝ තෝරා පත් කර ගැනීම, ප්‍රවර්ධන කිරිමේ හෝ වළක්වාලීමේ කාර්ය සඳහා භාවිත කිරීම, ඒ ඡන්ද විමසීමේ දී තරඟ කරන යම් අපේක්ෂකයෙකු හෝ දේශපාලන පක්ෂයක් හෝ යම් ස්වාධීන කණ්ඩායමක් විසින් භාවිතා කිරීම, කොමිෂන් සභාවේ උපදෙස් මත, කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ හෝ මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයාගේ ලිඛිත විධානයක් මගින්, තහනම් කිරීමේ බලය කොමිෂන් සභාවට හිමි වන හෙයින් ද කොමිෂන් සභාව සංස්ථාපනය කෙරෙන තෙක් එකී බලතල මැතිවරණ කොමසාරිස්වරයාට හිමිවන හෙයින් ද නාමයෝජනා දැන්වීම ප්‍රකාශයට පත් කළ දින සිට නාමයෝජනා කාල සීමාවේ ආරම්භක දිනය දක්වා වූ පූර්ව කාල සීමාව තුළ හා නාමයෝජනා කාල සීමාවේ ආරම්භක දිනය හා පාර්ලිමේන්තු මහ මැතිවරණ පවත්වා ප්‍රතිඵල ප්‍රකාශයට පත්කර අවසන් වන තෙක් වූ කාල සීමාව තුළ දී දේශපාලන පක්ෂ හෝ අපේක්ෂකයන් ප්‍රවර්ධනය කිරීමට හේතුවන නැතහොත් වෙනත් අපේක්ෂකයකු අගතියට පත්වන ආකාරයේ කටයුතු සඳහා රාජ්‍ය දේපල භාවිතා කිරීමෙන් වැළකිය යුතු බව හා රජයේ නිලධරයන්/ සේවකයන් බඳවා ගැනීම් යනාදී කරුණු සීමා කළ යුතු බව රාජ්‍ය දේපල හා වර්තමාන පාලනය භාරව සිටින අමාත්‍යාංශ ලේකම්වරුන් ප්‍රමුඛ සියලුම නිලධාරීන්ගේ අවධානය යොමු කිරීම් වස් මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ. මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙන් නිකුත් කර ඇති මෙම නියම ක්‍රියාත්මක කිරීමට සියලුම රජයේ හා රාජ්‍ය සංස්ථාවල ව්‍යවස්ථාපිත මණ්ඩලවල නිලධාරීන් බැඳී සිටින බව ද මෙයින් අවධාරණය කරනු ලැබේ.

02. (i) ඡන්ද විමසීම්වල දී පක්ෂ/ අපේක්ෂක ප්‍රවර්ධන කටයුතු සඳහා රජය සතු මෝටර් රථ, ජීප් රථ, බස් රථ ආදී සියළුම වාහන සහ හෙලිකොප්ටර් සහ ගුවන් යානා යොදවා ගන්නා බවට පසුගිය ඡන්ද විමසීම් අවස්ථාවල දී මෙම දෙපාර්තමේන්තුවට හා අදාළ සෙසු ආයතනවලට පැමිණිලි ලැබී ඇත. එබැවින් රජයේ වාහන භාරව සිටින සියලු නිලධාරීන් එම වාහන යම් අපේක්ෂකයකුගේ පාර්ලිමේන්තු මහ මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා භාවිතා නොවන ආකාරයට පාර්ලිමේන්තු මහ මැතිවරණ කාල සීමාව තුළ වාහන සංචිතය නඩත්තු කිරීම විශේෂ අවධානයකින් යුතුව සිදු කළ යුතු බව අවධාරණය කරමි. නිලධාරීන්ට වෙන් කර ඇති (assigned vehicles) රජය සතු වාහන සහ කුලියට ලබාගෙන රාජකාරී කටයුතු සඳහා යොදවන වාහන ද මීට ඇතුළත් වන බව සැලකිය යුතුය. මෙම කාල සීමාව තුළ දී නිලධාරීන්ට වෙන්කර ඇති (assigned vehicles)

වාහන හැර විශේෂයෙන්ම සංචිතවලට අනුයුක්ත වාහන සහ අනිකුත් වාහන සඳහා ධාවන සටහන් නියමාකාරයෙන් පවත්වා ගත යුතු අතර, මෙම ධාවන සටහන් මාණ්ඩලික නිලධාරියකු විසින් දිනපතා පරීක්ෂා කර එම වාහන, පාර්ලිමේන්තු මහ මැතිවරණ ප්‍රචාරක කටයුතුවලට නොයෙදෙන බවට සෑහීමකට පත්විය යුතුය. රාජකාරි කටයුතු සඳහා යෙදවූ බව ව්‍යාජ සටහන් යොදා රජයේ වාහන දේශපාලනමය ප්‍රවර්ධන කටයුතු වෙනුවෙන් යොදා තිබූ අවස්ථා පසුගිය ඡන්ද විමසීම්වලදී වාර්තා වී ඇති හෙයින් එවැනි ව්‍යාජ කරුණු සඳහා රජයේ වාහන නොයෙදවීමට වගබලා ගත යුතුවේ. අමාත්‍ය කාර්ය මණ්ඩලවල නිලධාරීන් ඇතුලු මාණ්ඩලික නිලධාරීන් සඳහා වෙන් කළ වාහන වුවද පක්ෂ/ අපේක්ෂක ප්‍රවර්ධනය සඳහා යොදවා ගැනීමට හිමිකමක් නැති බව අවධාරණය කරනු ලැබේ.

(ii) පාර්ලිමේන්තුව විසිරුවා හැර තිබියදී වුව එනම් අමාත්‍යවරුන්, රාජ්‍ය අමාත්‍යවරු හා නියෝජ්‍ය අමාත්‍යවරු පාර්ලිමේන්තු මැතිවරණය අවසන් වන තෙක් ස්වකීය තනතුරු දරන හෙයින් නිල වශයෙන් ඔවුනට හිමි වාහන තවදුරටත් භාවිතා කිරීමට අයිතිය ඇති නමුත් එම වාහන පක්ෂ/අපේක්ෂ ප්‍රවර්ධනය සඳහා වූ ධජ / පතාක/ ස්ටිකර් ප්‍රදර්ශනය වැනි කාර්යයන් සඳහා යොදවා ගැනීමෙන් වැළකිය යුතු බවට එකී වාහන භාරව ක්‍රියා කරන නිලධාරීන්/රියදුරන් දැනුවත් කළ යුතුවේ. එමෙන්ම නිල තත්වය නිසා හිමිවන වාහන හැර කිසිදු රජයේ වාහනයක් හෝ කුලී පදනම මත ලබාගත් වාහනයක් අමාත්‍යවරුන් වෙත (හෝ ඔවුන්ගේ කාර්ය මණ්ඩල වෙත) ලබා දීම හෝ නොකළ යුතුය.

(iii) ගරු ජනාධිපතිතුමා සඳහා වෙන් කර ඇති වාහන දෙකකට හැර වෙන කිසිදු වාහනයකට මෝටර් රථ දෙපාර්තමේන්තුව විසින් වෙන් කරනු ලැබූ අනන්‍ය ලියාපදිංචි අංකය රහිතව ධාවනය කළ නොහැකි බැවින් කිසිදු අමාත්‍යවරයෙකුට, නියෝජ්‍ය අමාත්‍යවරයෙකුට, හෝ රාජ්‍ය අමාත්‍යවරයෙකුට ඔවුන්ගේ කාර්ය මණ්ඩල සාමාජිකයන්ට හෝ වෙනත් කිසිවකුට අදාළ නියමිත ලියාපදිංචි අංකය රහිතව රජයේ හෝ රාජ්‍ය ආයතනවල වාහන භාවිතා කළ නොහැකිය. එබැවින් සියලු දෙපාර්තමේන්තු හා රාජ්‍ය ආයතන සතු වාහන ගරාජ අංකවලින් (ව්‍යාජ අංකවලින්) ධාවනයේ නොයෙදෙන බවට අමාත්‍යාංශ ලේකම්වරුන්/ දෙපාර්තමේන්තු ප්‍රධානීන් නිසැක විය යුතුය. රාජ්‍ය නොවන සංවිධානවලින් හෝ තානාපති කාර්යාලවලින් ප්‍රදාන ලෙස රජයට හෝ රාජ්‍ය ආයතනවලට හෝ පරිත්‍යාග ලෙස ලැබී ඇති වාහන වුවද විධිමත් ලෙස ලියාපදිංචි නොකළ අංක තහඩු සහිතව ධාවනය කළ නොහැක.

03. රජයේ කාර්යාල, ගොඩනැගිලි, පාසැල්, රජය සතු වෙනත් ගොඩනැගිලි සහ සංචාරක නිවාස ආදිය ද රජය සතු දේපල වේ. එම නිසා වැනි ස්ථාන දේශපාලන රැස්වීම්, සාකච්ඡා ආදියට යොදවා ගැනීම ද නොකළ යුතුය. පාර්ලිමේන්තු මහ මැතිවරණ ප්‍රචාරක කටයුතුවල යෙදී සිටින පුද්ගලයින්ට රජය සතු සංචාරක නිවාස, තානායම්, නිවාඩු නිකේතන ආදිය ද නොමිලේ ලබාදීම සම්පූර්ණයෙන්ම තහනම් බව ද සැලකිය යුතුය. එමෙන්ම එවැනි ස්ථානවල නවාතැන් ගන්නා පුද්ගලයින්ට මහ මැතිවරණයේ පක්ෂ/ අපේක්ෂකයින් ප්‍රවර්ධනය කිරීමේ කටයුතුවල නිරත වීමට ඉඩ නොදිය යුතුය. රජය සතු ගොඩනැගිලි සහ ඒවා පිහිටි භූමිවල මහ මැතිවරණයේ අපේක්ෂකයින්ගේ ප්‍රචාරක දැන්වීම්, පෝස්ටර් කටවුට් ආදිය ප්‍රදර්ශනය සඳහා භාවිතා කිරීමට ද කිසිසේත් ඉඩ නොදිය යුතුය.

04. (i) පාර්ලිමේන්තු මහ මැතිවරණ කාලය තුළ රජයේ මුදල් වැය කරමින් පවත්වනු ලබන විවිධ ආකාරයේ ජංගම සේවා, ප්‍රදර්ශන, විවෘත කිරීම් වැනි උත්සව දේශපාලන අංශවලට සම්බන්ධ පුද්ගලයින්ගේ සහභාගීත්වයෙන් සිදුකෙරෙන අවස්ථාවල දී පාර්ලිමේන්තු මහ මැතිවරණයට අදාළව නොයෙකුත් මතිමතාන්තර ඔවුන් වෙතින් ප්‍රකාශ වීමට ඉඩ ඇත. එබඳු ප්‍රකාශයක් පාර්ලිමේන්තු මහ මැතිවරණය සඳහා ඉදිරිපත් වන පක්ෂයක හෝ අපේක්ෂකයින්ගේ අපේක්ෂකත්වය ප්‍රවර්ධනය සඳහා අනිසි ලෙස බලපානු ඇත. මෙවැනි උත්සව පැවැත්වීමෙන් යම් අපේක්ෂකයකු ප්‍රවර්ධනය කිරීමට හෝ වෙනත් අපේක්ෂකයකුට අගතියක් වන බවට පැමිණිලි ලැබිය හැකි හෙයින් පාර්ලිමේන්තු මහ මැතිවරණ කාල සීමාව තුළ එබඳු උත්සව අවස්ථා පැවැත්වීමෙන් වැළකී සිටීම යෝග්‍ය බව පෙන්වා දෙනු කැමැත්තෙමි. අත්‍යාවශ්‍යයෙන්ම පැවැත්වීමට සිදුවන උත්සව/ වැඩසටහන් සඳහා දේශපාලනඥයන් සහභාගී කරවා ගැනීමෙන් වැළකී සිටීමට ක්‍රියා කළ යුතු බව දන්වා සිටිමි. මහජනතාවගේ අවශ්‍යතා සපුරාලීම සඳහා අත්‍යාවශ්‍ය ජංගම සේවා මෙම පාර්ලිමේන්තු මහ මැතිවරණ කාලසීමාව තුළ පැවැත්වීමට පාර්ලිමේන්තු මහ මැතිවරණයට අදාළ නාමයෝජනා කැඳවීමේ දැන්වීම නිකුත් කිරීමට පෙර නියම කරගෙන ඇත්නම් එවැනි අවස්ථා පිළිබඳව වහාම මා වෙත දැන්වීමට ක්‍රියා කළ යුතු වේ. එවිට ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ගය සම්බන්ධයෙන් උපදෙස් ලබා දෙනු ඇත. කෙසේ වුවද, නාමයෝජනා භාරගැනීම අවසන් වීමෙන් පසුව මෙවැනි කාර්යයන් සිදු කිරීමෙන් වැළකී සිටීම වඩාත් යෝග්‍ය බැවින් එවැනි කටයුතු පිළිබඳව අනුමැතිය ලබා දීම බෙහෙවින් සීමා කරනු ඇත. එසේ වුවත් පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් හෝ රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ජංගම සේවා සඳහා මෙම සීමා කිරීම බලනොපැවැත්වේ. මෙවැනි ජංගම සේවා ද රජයේ නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් පමණක් පැවැත්වීමට වගබලා ගත යුතු බව අවධාරණය කරනු ලැබේ.

(ii) ඡන්ද විමසීම් කාලසීමාව තුළදී කිසිදු ස්ථානයක රජයේ ඉඩම් බෙදා දීම්, රජයේ ඉඩම් හිමිකම් ඔප්පු හෝ නිවාස අයිතිය පැවරීමේ ඔප්පු ප්‍රදානය කිරීම්, වැවිලි කර්මාන්ත සඳහා හෝ වගා කටයුතු සඳහා සහනාධාර, පොහොර, කෘෂි උපකරණ, ක්‍රීඩා භාණ්ඩ, ස්වයං රැකියා සඳහා උපකරණ, පාපැදි, සූර්ය බල විදුලි පද්ධති, නිවාස ඉදිකිරීම් සඳහා වූ ගොඩනැගිලි ද්‍රව්‍ය යනාදිය බෙදාහැරීමේ ව්‍යාපෘති හා නිවාස ණය නිකුත් කිරීම්/ වන්දි මුදල් ප්‍රදානය කිරීම් වැනි වැඩසටහන් අත්හිටුවිය යුතු ය. මෙවැනි ආධාර හෝ ඉල්ලුම්පත්‍ර යනාදිය ලබාදෙන බවට රාජ්‍ය නිලධාරීන් විසින් නිවේදන නිකුත් කර ඒ සඳහා ලැයිස්තු සකස් කිරීමද මෙම කාලසීමාව තුළ නොකළ යුතුය. තවද, නිවාස ණය ආධාර ලබා දීම සඳහා ආකෘති බෙදා හැරීම, ගොඩනැගිලි ද්‍රව්‍ය ලබා දීම සඳහා ආකෘති බෙදා හැරීම වැනි කටයුතු සිදු කිරීමද අත්හිටුවිය යුතුය. මක්නිසාදයත්, එවැනි

කාර්යයන් මගින් ඡන්දදායකයන්ට සංග්‍රහ කිරීමේ වරද සිදු කරන බවට පැමිණිලි ලැබෙන හෙයින් හා මෙවැනි ව්‍යාපෘති හා වැඩසටහන් මගින් අපේක්ෂකයන් ප්‍රවර්ධනය සිදු කරන බවට පැමිණිලි ලැබෙන හෙයිනි.

(iii) නාමයෝජනා දැන්වීම නිකුත් කිරීමට පෙර පූර්ව සංවිධාන කටයුතු ඉටුකර තිබූ උත්සව හා වැඩසටහන් වුවද නාමයෝජනා දැන්වීම ප්‍රකාශයට පත්කිරීමෙන් පසු පැවැත්වීම හෝ ක්‍රියාත්මක කිරීම සුදුසු නොවේ. නාමයෝජනා කාලසීමාව තුළ එනම්, 2015 ජුලි 06 හා 13 දිනයන් අතර පැවැත්වීමට යෝජිත උත්සව අවලංගු කිරීමට අපහසුතා ඇත්නම් ඒ පිළිබඳව මා වෙත දන්වා ලිඛිත පූර්ව අනුමැතිය ලබා ගැනීමෙන් තොරව එවැනි උත්සව පැවැත්වීම නීති උල්ලංඝනය කිරීමක් ලෙස සැලකේ. නාමයෝජනා කාලසීමාවෙන් පසු පැවැත්වීමට යෝජිත එවැනි උත්සව කල්තබන ලෙස මෙයින් දන්වා සිටින අතර, කිසිසේත්ම කල්තැබිය නොහැකි කාර්යයන් ඇත්නම් ඒ පිළිබඳව අමාත්‍යාංශ ලේකම්වරුන් විසින් ස්වකීය පෞද්ගලික දැනුවත් බව හා වගකීම මත මා වෙත දන්වා අනුමැතිය ඉල්ලා සිටිය යුතු ය. එවැනි අවස්ථා පිළිබඳව අනුමැතිය දීමට පෙර දේශපාලන පක්ෂ නියෝජිතයන්ගේ හා නිරීක්ෂණ සංවිධානවල නියෝජිතයන් සහභාගීත්වයෙන් යුතු කමිටුවේ දී සාකච්ඡා කිරීමට අපේක්ෂා කෙරේ. අනුමැතිය ලබාදෙන එවැනි ව්‍යාපෘති / වැඩසටහන් වුවද ක්‍රියාත්මක කළ යුත්තේ කිසිදු පක්ෂයකට/ අපේක්ෂකයකුට විශේෂ වාසියක් (හෝ අගතියක්) නොවන පරිදි වන බවත්, ඒ සඳහා අදාළ නිලධාරීන් පමණක් සහභාගී විය යුතු බවත් සැලකිය යුතුය.

05. *(i) තවද මෙම පාර්ලිමේන්තු මහ මැතිවරණයට අදාළව රජයේ හෝ රාජ්‍ය සංස්ථා ඇතුළු ආයතනවල නිලධාරීන් කිසිවකුට කාර්යාල වේලාව තුළ හෝ කාර්යාල දිනවල රාජකාරි නිවාඩු ලබාගෙන හෝ කිසියම් අපේක්ෂකයකු ප්‍රවර්ධනය කිරීම සඳහා හෝ කිසියම් අපේක්ෂකයකුට එරෙහිව ක්‍රියා කිරීම සඳහා අවකාශ නොදිය යුතු අතර එසේ ක්‍රියා කරන නිලධාරීන් / සේවකයන් පිළිබඳව දැඩි විනයානුකූල ක්‍රියාමාර්ග ගත යුතුවේ.*

*(ii) අමාත්‍යාංශ ලේකම්වරුන් ඇතුලු දේශපාලන අයිතිවාසිකම් අහිමි රජයේ මාණ්ඩලික නිලධාරීන්,සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල මාණ්ඩලික නිලධාරීන්, විදුහල්පතිවරුන්, පොලිස් නිලධාරීන්, ග්‍රාමනිලධාරීන් / වන නිලධාරීන් වැනි සාම නිලධාරීන් හා ආරක්ෂක අංශවල සාමාජිකයින් ස්වකීය කාර්යාල වේලාවල තුළ පමණක් නොව කාර්යාල වේලාවෙන් බැහැරව මෙන්ම නිවාඩු දිනවලදී වුවද වක්‍රව හෝ සෘජුව හෝ කිසිදු පක්ෂයක්/ අපේක්ෂකයකු ප්‍රවර්ධනය වන ආකාරයේ නැතහොත් අගතියට පත්වන ආකාරයේ ක්‍රියාකාරකම්වලට සහභාගී වීමෙන් හෝ ඒවාට අනුබල දීමෙන් හෝ වැළකී සිටිය යුතුය. එනම්, දේශපාලන අයිතිවාසිකම් රහිත සියලුම නිලධාරීන්ට දේශපාලනමය කටයුතුවල යෙදීමට අවසර නොමැති බවට වූ නියමය ඉතා තදින් බලාත්මක කළ යුතුය.*

*(iii) තවද සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සභාපතිවරුන් හා අධ්‍යක්ෂවරුන්ද මෙම ඡන්ද විමසීම් කාල සීමාව තුළදී කිසිදු අපේක්ෂකයකු ප්‍රවර්ධනයට හෝ අගතියට පත්වන ආකාරයේ ක්‍රියාකාරකම්වල යෙදීමෙන් වැළකී සිටිනු ඇතැයි කාරුණිකව අපේක්ෂා කරනු ලැබේ.*

06. (i) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ අධිකරණ සේවා කොමිෂන් සභාවේ අනුමැතිය යටතේ විධිමත් ලෙස ප්‍රසිද්ධ දැන්වීම් හෝ ගැසට් නිවේදන මගින් ඉල්ලුම්පත්‍ර කැඳවා කරනු ලබන බඳවාගැනීම්, පත්වීම්, උසස්වීම් හා මාරු කිරීම් හැර පාර්ලිමේන්තු මහ මැතිවරණය සඳහා නාමයෝජනා කැඳවා ඇති විටෙක, මැතිවරණ කොමිෂන් සභාවේ නැතහොත් මැතිවරණ කොමසාරිස්ගේ නිසි අවසරය නොමැතිව රාජ්‍ය ආයතනයන්හි කිසිම ආකාරයක බඳවා ගැනීම්, පත්වීම් හා උසස්වීම් සිදුකිරීමෙන් වැළකී සිටිය යුතු බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

(ii) පාර්ලිමේන්තු මහ මැතිවරණ රාජකාරි සඳහා යොදවා ගැනීමට අපේක්ෂිත රජයේ විද්‍යාලයන්හි ගුරුවරුන්, විදුහල්පතිවරුන් ඇතුළු සියලුම රජයේ නිලධාරීන්ගේ සාමාන්‍ය ස්ථාන මාරුවීම් නාමයෝජනා දැන්වීම ප්‍රකාශයට පත්කිරීමේ දින සිට පාර්ලිමේන්තු මහ මැතිවරණය අවසන් වී සති 02ක් ගතවනතුරු අත්හිටුවිය යුතු අතර, පාර්ලිමේන්තු මහ මැතිවරණ රාජකාරි සඳහා යොදවනු නොලබන රජයේ හෝ රාජ්‍ය සංස්ථා නිලධාරීන් හෝ පාර්ලිමේන්තු මහ මැතිවරණ කාල සීමාව තුළ ස්ථාන මාරු කිරීමේ දී දේශපාලන හේතූන් මත එකී ස්ථාන මාරුවීම් සිදු කරනු ලැබූ බවට පැමිණිලි නොලැබෙන සේ අදාළ ස්ථාන මාරු කිරීම් සිදුකිරීමට සියලුම බලධාරීන් කටයුතු කිරීම යෙහෙකි.

(iii) පාර්ලිමේන්තු මහ මැතිවරණ කාල සීමාව තුළ, සේවයේ නියුතු නිලධාරීන් අත්‍යාවශ්‍ය හේතූන් මත උදාහරණ වශයෙන් ශිෂ්‍යත්ව, උසස් අධ්‍යාපනය, වෛද්‍ය ප්‍රතිකාර, වන්දනා ගමන් යනාදිය සඳහා සිදු කෙරෙන විදේශ ගමන් සීමා කිරීමට අපේක්ෂා නොකෙරේ. එබැවින් එවැනි අවශ්‍යතා සඳහා නිලධාරී විදේශගත වීම් සම්බන්ධයෙන් මැතිවරණ කොමසාරිස් වෙතින් පූර්ව අනුමැතිය ලබා ගැනීමේ අවශ්‍යතාවක් නැත. එසේ වුවද නිලධාරීන් සමූහ වශයෙන් මෙම කාලය තුළ විදේශගත වන්නේ නම් ඒ සඳහා පූර්ව අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය වේ. එසේ වුවද ඉතා හදිසි හා කල් තැබිය නොහැකි හේතු නිසා විදේශගතවීම් අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා අනුමැතිය දීම පිළිබඳව සලකා බලනු ලබන හෙයින් එවැනි අවස්ථා සම්බන්ධයෙන් වූ ඉල්ලීම් කල්වේලා ඇතිව ඉදිරිපත් කිරීම යෙහෙකි.

(iv) පාර්ලිමේන්තු මහ මැතිවරණ ප්‍රකාශයට පත් කිරීමට පෙර ආරම්භ කර තිබූ නිලධාරීන් බඳවා ගැනීම්/ උසස් කිරීම්වලට අදාළ දීප ව්‍යාප්ත වැඩපිළිවෙලක් කල්දැමීමකින් තොරව ක්‍රියාත්මක කළ යුතුයයි අමාත්‍යාංශ ලේකම්වරයා අපේක්ෂා කරන විට දී හා සමස්ත දිවයිනටම බලපාන පරිදි රාජ්‍ය සේවයට හෝ රාජ්‍ය ආයතනවලට අදාළ වන පරිදි විධිමත්ව, දේශපාලන මැදිහත්වීම්වලින් තොරව සිදු කෙරෙන වෙනත් බඳවා ගැනීම්/ උසස් කිරීම් සඳහා මෙම චක්‍රලේඛයේ සීමා කිරීම් අදාළ නොවන බවත් 2015.06.26 දිනෙන් පසු මේ දක්වා කරනු ලැබූ හා ඉදිරියේ දී කිරීමට යෝජිත එවැනි කාර්යයන් සම්බන්ධයෙන් සවිස්තර වාර්තා මා වෙත එවීමට අමාත්‍ය ලේකම්වරුන්, පළාත් සහා ප්‍රධාන ලේකම්වරුන් ඇතුළු සෙසු බලධාරීන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ සංස්ථා මණ්ඩල, විශ්වවිද්‍යාල ඇතුළු රාජ්‍ය ආයතන ප්‍රධානීන් ක්‍රියා කළ යුතු බවත් මෙයින් දන්වා සිටිනු ලැබේ. විධිමත් ලෙස විනිවිදභාවයෙන් යුතුව අත්‍යාවශ්‍යම හා හදිසි කාර්යයන් සඳහා පමණක් අනුමැතිය ලබා දීමට ක්‍රියා කරනු ලැබේ. එමෙන්ම එවැනි කාර්යයන් පිළිබඳව නිසි සටහන් තබා ගැනීමට අවශ්‍ය බව අදාළ සියළුම නිලධාරීන්ට උපදෙස් දීම අත්‍යාවශ්‍යය. මක්නිසාද යත් ඡන්ද විමසීම් කාලසීමාව තුළ මෙන්ම ඉන්පසුව වුවද මෙවැනි කරුණු සම්බන්ධයෙන් පැමිණිලි හා චෝදනා ලැබිය හැකි බැවිනි. එමෙන්ම මැතිවරණ කොමසාරිස්ගේ අනුමැතිය ලබා දෙන එවැනි පත්වීම්, උසස් වීම් මෙම කාල සීමාව තුළ සිදු කරන්නේ නම් එම කාර්යයන්ට අනුදත් බඳවා ගැනීමේ පටිපාටිවලට අදාළව විධිමත් ක්‍රමවේද භාවිතා කරමින් විනිවිද භාවයෙන් යුතුව, දේශපාලන පක්ෂපාතීත්වය පිළිබඳ පැමිණිලි නොලැබෙන සේ සිදු කරන බව අමාත්‍යාංශ ලේකම්වරයා හා අදාළ බඳවා ගැනීම් බලධරයා පෞද්ගලිකවම සෑහීමකට පත්වීම අත්‍යවශ්‍යය. මක්නිසාද යත් අවසාන වශයෙන් වගකීමට බැඳී සිටින්නේ ඔවුන් බැවිනි.

**(v) මෙම කාලසීමාව කිසිම ආකාරයක පත්වීම් හෝ උසස්වීම් හෝ ස්ථාන මාරුවීම් පෙරදාතම් යොදා නිකුත් කිරීම ඡන්ද විමසීම් නීති උල්ලංඝණය කිරීමක් ලෙස සලකා ක්‍රියා කිරීමට සිදුවන බව අවධාරණය කරමි.**

(vi) තවද, කිසියම් විශේෂිත අත්‍යවශ්‍ය කරුණක් හේතුවෙන් (එනම් විනය ක්‍රියාමාර්ග, නිලධාරියාගේ ඉල්ලීම මත සානුකම්පිතව ක්‍රියාකිරීමට සිදුවීම, යම්කිසි පාඨශාලාවකට අත්‍යාවශ්‍ය ගුරුවරුන් ලබාදීම වැනි කරුණු හේතුවෙන්) පාර්ලිමේන්තු මහ මැතිවරණ පැවැත්වීමට නියමිත කාලසීමාවේදී නිලධාරීන්/ ගුරුවරුන්/ විදුහල්පතිවරුන් ස්ථාන මාරුකිරීමට සිදුවන විට එම මාරුකිරීම් දේශපාලනමය සිද්ධීන් නිසා කරනු ලබන මාරුවීම් නොවන බවට සනාථ කළ හැකි නම් නැතහොත් ඒ සම්බන්ධයෙන් පැමිණිලි/ චෝදනා නොලැබේ නම් එවැනි මාරුවීම් සම්බන්ධයෙන් මැතිවරණ මහලේකම් කාර්යාලය දැනුවත් කරනු ලැබූ පසු ඒ සඳහා අනුමැතිය ලබාදිය හැකිය.

07. (i) **රාජ්‍ය දේපල විශේෂයෙන්ම රජයේ ආයතන හා නිලධාරීන් පක්ෂ/ අපේක්ෂක ප්‍රවර්ධනය සඳහා යෙදවීමේ ප්‍රවණතාවක් ඇති බවට පසුගිය ඡන්ද විමසීම්වල දී පැමිණිලි ලද හෙයින් එවැනි අකටයුතු සඳහා කිසිදු අවකාශයක් නොදිය යුතු ය. පසුගිය ඡන්ද විමසීම්වල දී ලද පැමිණිලිවලින් වාර්තා වූ පරිදි ඡන්ද විමසීම පැවැත්වෙන ප්‍රදේශයන්වල හදිසි රාජකාරි කටයුතු හෝ විශේෂ සංවර්ධන ව්‍යාපෘති ඉටු කිරීම යනාදී කරුණු ඉදිරිපත් කරමින් පක්ෂ/අපේක්ෂක ප්‍රවර්ධනය කිරීම සඳහා (නැතහොත් අගතියට පත් කිරීම සඳහා) රජයේ / රාජ්‍ය ආයතනවල නිලධාරීන් හා රජයේ / රාජ්‍ය ආයතන සතු හෝ කුලියට ගත් වාහන අනුයුක්ත කිරීම් වැනි අකටයුතු සිදු කිරීමට කිසිදු නිලධරයකුට ඉඩ නොදිය යුතු බව කාරුණිකව දන්වා සිටිමි. එමෙන්ම පාර්ලිමේන්තු මහ මැතිවරණ කාලය තුළ විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ද කල් තැබිය යුතුවේ.**

**(ii) රාජ්‍ය ආයතන සතු දේපල හෝ රාජ්‍ය ආයතනවලින් සැපයෙන සේවා හෝ කිසිදු දේශපාලන පක්ෂයකට හෝ අපේක්ෂකයකුට හෝ අපේක්ෂකයකුගේ සහාය සඳහා ක්‍රියා කරන ආයතනයකට/ පුද්ගලයකුට ණය පදනම මත හෝ විශේෂ වට්ටම් යටතේ ලබාදීම නොකළ යුතු ය.**

08. මෙම පාර්ලිමේන්තු මහ මැතිවරණයේ දී කිසිදු අපේක්ෂකයකු තෝරා පත්කර ගැනීම ප්‍රවර්ධනය කිරීමේ හෝ වළක්වාලීමේ කාර්යයන් වෙනුවෙන් රාජ්‍ය දේපල භාවිතා කිරීම වළක්වාලමින් කර ඇති මෙම තහනම කිසිඳු ලිහිල් කිරීමකින් තොරව තදින්ම ක්‍රියාත්මක කළ යුතුය. තවද, ඒ ඒ අමාත්‍යාංශය යටතේ ඇති සියලුම දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා වෙනත් ආයතනවල ප්‍රධානින්ට ද මේ පිළිබඳව උපදෙස් දීමට ක්‍රියා කරන ලෙස අමාත්‍යාංශ ලේකම්වරුන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ. එමෙන්ම එම සියලු ආයතනවල නිලධාරීන් මෙම උපදෙස් හා නියමයන්ට අනුකූලව ක්‍රියාකරන බවට අමාත්‍යාංශ ලේකම්වරුන් හා ආයතන ප්‍රධානීන් නිසැකවීම අත්‍යවශ්‍යය.

09. පාර්ලිමේන්තු මහ මැතිවරණයට අදාළ සියලුම නීති බලාත්මක කිරීමට, සුරක්ෂිත කිරීමට මැතිවරණ කොමිෂන් සභාවට/ මැතිවරණ කොමසාරිස්වරයාට සහාය දැක්වීම අදාළ නීති බලාත්මක කිරීම භාරව සිටින සියලුම රජයේ බලධරයන්ගේ කාර්යය විය යුතු බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ආ (2) හා දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 උ උ ව්‍යවස්ථාවෙහි කර ඇති සඳහන් පිළිබඳව ඔබගේ විශේෂ අවධානය යොමු කිරීම අත්‍යවශ්‍ය බව කාරුණිකව දන්වා සිටිනු කැමැත්තෙමි.

**10. මෙම චක්‍රලේඛ ලිපියේ සඳහන් කරුණු පිළිබඳව අමාත්‍යවරු, නියෝජ්‍ය අමාත්‍යවරුන් රාජ්‍ය අමාත්‍යවරුන් සහ අමාත්‍ය කාර්ය මණ්ඩල දැනුවත් කිරීම අමාත්‍යාංශ ලේකම්ධරයා වෙත පැවරෙන බවද පළාත් සභාවල ප්‍රධාන අමාත්‍යවරුන් හා සෙසු අමාත්‍යවරුන් දැනුවත් කිරීම, ප්‍රධාන ලේකම්වරයා හා අදාළ පළාත් සභා අමාත්‍ය ලේකම්වරුන්ගේ වගකීම බවත් සලකනු මැනවි.**

11. එමෙන්ම අදාළවන විට කොමිෂන් සභාවල ලේකම්වරුන් එකී කොමිෂන් සභාවල සභාපතිවරුන් හා සාමාජිකයන් චක්‍රලේඛය පිළිබඳව දැනුවත් කිරීමට ක්‍රියා කළ යුතුවේ.

12. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් කරුණුවලට අමතරව, ඔබේ අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ ප්‍රධාන ගණන් දීමේ නැතහොත් ගණන් දීමේ නිලධාරී වශයෙන් ද රජය සතු දේපල අනිසි ලෙස පරිහරණය කිරීම වැළැක්වීම ද අදාළ නිලධාරීන්ගේ වගකීමක් බව මෙහි ලා සඳහන් කරමි.

13. මෙම ලිපියේ සඳහන් කරුණු පිළිබඳව සුපුරුදු පරිදි පිළිගත් දේශපාලන පක්ෂ, මැතිවරණ නිරීක්ෂණ සංවිධාන දැනුවත් කරනු ලබනු ඇති අතර "මැතිවරණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, පොලිස් නිලධාරීන්, දේශපාලන පක්ෂ නියෝජිතයින් හා මැතිවරණ නිරීක්ෂණ සංවිධානවල නියෝජිතයින්ගෙන් සමන්විත ඡන්ද විමසීම් සම්බන්ධයෙන් වූ පැමිණිලි පිළිබඳව ක්‍රියාකිරීමේ මධ්‍යස්ථානය" විසින් මෙහි සඳහන් කරුණුවලට අදාළව ලැබෙන පැමිණිලි ගැන විමර්ශනය කරනු ඇති බවත් ඡන්ද පෙත්සම්වලදී සහ අගතියටපත් පාර්ශ්ව

විසින් ගනු ලබන වෙනත් අධිකරණ ක්‍රියාමාර්ගවල දී මෙහි සඳහන් උපදෙස්වලට අනුකූල නොවන ක්‍රියා පිළිබඳව තොරතුරු ඉදිරිපත් කිරීමට අවකාශ ඇති බවත් වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

14. නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්විය හැක්කේ සියලුම රාජ්‍ය නිලධාරීන්ගේ සහාය ලදහොත් පමණක් හෙයින් මෙම පාර්ලිමේන්තු මහා මැතිවරණය නියමානුකූලව පැවැත්වීම සඳහා සියලුම රාජ්‍ය නිලධාරීන්ගේ විශේෂයෙන්ම ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන්ගේ සහාය ඉතා ඕනෑකමින් හා කරුණාවෙන් අපේක්ෂා කෙරේ.

**මහින්ද දේශප්‍රිය**
**මැතිවරණ කොමසාරිස්**

පිටපත් -

1. ජනාධිපති ලේකම් - දැනගැනීම පිණිස
2. අග්‍රාමාත්‍ය ලේකම් - දැනගැනීම පිණිස
3. අමාත්‍ය මණ්ඩල ලේකම් - දැනගැනීම පිණිස
4. විගණකාධිපති , විගණකාධිපති දෙපාර්තමේන්තුව - දැනගැනීම පිණිස
5. ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව - දැනගැනීම පිණිස
6. ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභාව - දැනගැනීම පිණිස
7. අධ්‍යක්ෂ ජනරාල්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව - දැනගැනීම පිණිස
8. සියලුම අමාත්‍යාංශවල පරිපාලන විෂයය භාර අතිරේක ලේකම්වරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරුන්
   - දැන ගැනීම පිණිස හා ක්‍රියා කිරීම සඳහා
9. ත්‍රිවිධ හමුදාපතිවරුන් / සිවිල් ආරක්ෂක දෙපාර්තමේනතුවේ අධ්‍යක්ෂ ජනරාල්
   - දැනගැනීම පිණිස සහ අවශ්‍ය කටයුතු සඳහා
10. පොලිස්පති - දැන ගැනීම පිණිස සහ ඡන්ද විමසීම් නීති බලාත්මක කරන නිලධාරීන් දැනුවත් කිරීම වස්.
11. සියලුම තේරීම්භාර නිලධාරීන් වෙත
    - මෙම ලිපියේ සඳහන් උපදෙස් හා නියමයන්ට එරෙහිව සිදුවන කටයුතු පිළිබඳව ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් නොපමාව මා වෙත වාර්තා කිරීම පිණිස හා එවැනි කටයුතු වළක්වාලීමට අවශ්‍ය පියවර ගැනීම පිණිස
12. සියලුම දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය/ නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත
    - දැන ගැනීම සඳහා සහ ඔබ දිස්ත්‍රික්කයේ සියලුම රාජ්‍ය ආයතන ප්‍රධානීන්, සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් සහ නාගරික කොමසාරිස්වරුන්, නගර සභා සහ ප්‍රාදේශීය සභා ලේකම්වරුන් වෙත මෙම ලිපියේ පිටපතක් යැවීම සඳහා සහ එහි සඳහන් ආකාරයට කටයුතු කරන ලෙස දැන්වීම පිණිස